**වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දිනද සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | ඉදිරි කාලවලදී මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ එම නිසා ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව මාර්ගයෙන් තක්සේරු කර පොත්වල දැක්විය යුතු වේ. | අදාල දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 126 iii (ඊ) වගන්තිය | අනවසර ප්‍රචාරණයන් 58 ක් සම්බන්ධයෙන් ආදායම් පරික්ෂකවරයා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලවලදී මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරනු ලැබේ. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 | සභාව විසින් බාහිර පාර්ශවයන්ට ලබාදී තිබූ රු. 314,897.00ක් වටිනා අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ii) මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවිය යුතු රු. 2,557,886.00 ක් වටිනා රඳවා ගැනීමේ මුදල් සහ | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | මූල්‍ය රෙගුලාසි අනුව මුදල් ආපසු ගෙවීමට කටයුතු කරමින් සිටී. |

| | | | |
|---|---|---|---|
| | ලංසු තැන්පතු 39 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය | | | |
| 2017 මාර්තු 07 දිනැති අංක PE/01/2017 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 04 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | මෙම වාහන 04 සඳහා ඉන්ධන පරිභෝජනය පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කර ඇත. |

**1.4.2** **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | විකුණුම් ආයතනවලින්, බැංකුවලින් සහ කොමිස් ලබා ගන්නා ස්ථානවලින් විකුණුම් විස්තර ලබාගෙන කොමිස් අයකළ යුතු වේ. | බදු අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.91,347,285 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 88,557,121 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 674,390 | - | 4,789,809 | 7,818,398 | 596,560 | - | 555,195 | 5,388,509 |
| කුලී | 19,958,110 | - | 16,211,489 | 355,891 | 18,811,450 | - | 20,774,317 | 362,892 |
| බලපත්‍ර ගාස්තු | 4,494,100 | - | 4,873,396 | 15,000 | 3,467,700 | - | 5,112,490 | - |
| වෙනත් ආදායම් | 115,379,590 | - | 136,701,293 | | 108,885,210 | - | 116,554,249 | - |
| එකතුව | **140,506,190** | **-** | **162,575,987** | **8,189,289** | **131,760,920** | **-** | **142,996,251** | **5,751,401** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.142,996,250 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.162,575,986 කින් වැඩි වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.19,579,736 කින් වැඩි වී තිබුණි. එසේ වුවත්, බිල් කළ ආදායම් ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | මින් ඉදිරියේදී ආදායම් බිල් කර රැස්කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) සභාව විසින් පසුගිය වර්ෂ 05 ක් පුරා බිල් නොකිරීමෙන් අදාළ ආදායම් පිළිබඳ හිඟහිටි ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | සභාවේ ආදායම් බිල් කර රැස්කිරීමට කටයුතු කළ යුතු වේ. | මින් ඉදිරියේදී ආදායම් බිල් කර රැස්කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ හිඟ වරිපනම් හා බදු රු.7,818,395 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | දේපළ මත වරිපනම් බදු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.14,000 ක් අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ කඩ කුලී අයකිරීමට අධිකරණයේ නීතිමය කටයුතු කරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හිඟ බදු රු.324,174 ක් පසුගිය වර්ෂ 06 ක සිට අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ බදු කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ කුලී අයකිරීමට අධිකරණයේ නීතිමය කටයුතු කරමින් පවතී. |

### 2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

#### උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.9,106,873 ක් සහ මුද්දර ගාස්තු රු.199,013,058 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට කටයුතු කෙරේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුවවිහරණය, පහසුකම් සහ සුභසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරණු පහත සඳහන් පරිදි විය.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 26ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණි. | සඳහන් වූ සියළුම කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 26 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් සකස් කළ යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඒ අනුව කටයුතු කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී ආවරණය කළ වාහන භාවිතා නොකර විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගවල ගමන් කරන ජනතාවට සෞඛ්‍ය සම්බන්ධ ගැටළු ඇති වී තිබූ අතර ප්‍රමාණයට අධිකව කසළ ප්‍රවාහනය කිරීම නිසා කසළ මාර්ගය පුරා වැටී තිබුණි. | අපද්‍රව්‍ය රැස්කිරීමේදී ආවරණය කළ වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි අනාගතයේදී ආවරණය කළ වාහන භාවිතා කෙරේ. |
| (ii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන් 43දෙනෙකුට වාර්ෂිකව සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වාර්ෂිකව කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (iii) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී වෙන් කිරීමකින් තොරව එකට රැස් කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී වෙන් කර රැස් කිරීමට කළ යුතු වේ. | වෙන් කර රැස් කිරිමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**(ඇ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. | වැලැක්වීම සඳහා අනාගතයේදී කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන ටයර් මාරු කිරීම සඳහා සභාව විසින් තැන්පත් කරන ලද නිදන් අරමුදලේ ස්ථාවර තැන්පතුව අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා නොකර අඛණ්ඩව තැන්පතුවක් ලෙස පැවතුනි. | නිදන් අරමුදල් තැන්පතු අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කළ යුතුය. | පිළිතුරු දී නැත. |
| (ආ) | 2016 සහ 2017 වර්ෂවලදී ප්‍රජා මධ්‍යස්ථානවලට ලබාදුන් රු. 260,000 ක සහනාධාර සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ප්‍රජා මධ්‍යස්ථානවල ලබාදීමට පියවර ගත යුතුය. | ප්‍රදාන ලබාදීමට පියවර ගනිමින් සිටී. |
| (ඇ) | සභාවේ පුත්තූර් උප කාර්යාලයේ දේපළ මත තක්සේරු බදු සඳහා වූ ලේඛනය 1995 වර්ෂයේදී විනාශ කර තිබුණි. කෙසේවෙතත්, මේ දක්වාම ලේඛනය සකස් කර නොතිබුණි. | දේපල සඳහා තක්සේරු බදු ලේඛනයක් සකස් කිරීමේ කටයුතු වේගවත් කිරීමට පියවර ගත යුතුය. | දේපල සඳහා තක්සේරු බදු ලේඛනයක් සකස් කිරීමට පියවර ගනිමින් සිටී. |
| (ඈ) | 2015 දී රු.1,348,298 ක වියදමින් ඉදිකළ ඝාතකාගාරය වර්ෂ 05 ක් අක්‍රියව පැවතුනි. කෙසේ වෙතත්, මෙම ඝාතකාගාරය ක්‍රියාත්මක කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | ඝාතකාගාරය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. | ඝාතකාගාරය ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින් සිටී. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | සභාව විසින් ජනතාවට සැලසිය යුතු සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. | නියමිත කාලයේදි ජනතාවට සේවාවන් සැපයීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 21 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කර ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මත ප්‍රාදේශීය සභාව විසින් බදු පදනම මත 2016 වර්ෂයේදී ලබා දුන් මස් කඩය සඳහා රු.300,000ක් බදුකරුගෙන් වර්ෂ 03 ක කාලයක සිට අය කර ගෙන නොමැති අතර මේ සම්බන්ධයෙන් 2016 ඔක්තෝබර් 13 දින අංක 757/18 නඩුව පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම කරුණ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය වී නොමැත. | උසාවි නඩුවක ඉතිරිව ඇති හිඟ හිඟ බදු පිළිබඳ කරුණු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය | මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ. |
| (ආ) | ඉදිකරන ලද අනවසර මායිම් බැම්ම සම්බන්ධයෙන් අංක MC / 2937 / S / 15 නඩුවක් ගොනු කර තිබුණි. කෙසේ වෙතත්, මෙම කරුණ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය වී නොමැත. | උසාවි නඩුවට අදාළ කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළි කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

-------------------------------

**3.5.1 නඩත්තුව හා අළුත්වැඩියා කිරීමට අසමත් වීම**

-----------------------------------------------

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රෝද දෙකේ ට්‍රැක්ටරයක් අලුත්වැඩියා නොකොට වසර 02 ක් තිස්සේ අඛණ්ඩව සභාව තුළ භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවතුනි. | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ උපදේශනය ලබා ගැනීමට සහ එවැනි ට්‍රැක්ටරයක් භාවිතා කිරීමට නිසි පියවර ගත යුතුය. | වෙන්දේසියෙන් විකිණීමට පියවර ගෙන ඇත. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

-----------------------

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ භාවිතයේ පවතින වාහන 06 ක අයිතිය මාරු කිරිමට කටයුතු කර නොතිබුණි. | සභාවට පැවරීමට කටයුතු කළ යුතු වේ. | වාහන 05 ක අයිතිය සභාවට පැවරීමට පියවර ගනිමින් තිබේ. |

**3.6 ප්‍රසම්පාදනය**

---------------

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවාවන් සඳහා සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශයේ සඳහන් පරිදි සෑම වර්ෂයක් සඳහාම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කළ යුතුය. | සෑම වසරකම ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් ඉදිරි කාලවලදී සකස් කරනු ලැබේ. |

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාවේ අයවැය ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් මත ගමන් වියදම්, සහනාධාර හා උපකාර මුදල්, විශ්‍රාම වැටුප් ආදි තථ්‍ය වියදම්වලින් වැඩි ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. මේ නිසා අයවැය එක් ඵලදායී පාලන කාරකයක් නොවූ බව දක්නට ලැබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරි කාලවලදී අයවැය සකස් කිරීමේදී මෙම කරුණු සලකා බලනු ලැබේ. |
| (ආ) 2018 වර්ෂයේ අයවැයෙන් සහා අරමුදල මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති රු. 27,900,000 ක් වටිනා මූලධන කාර්යයන් 16 ක් මුළුමනින්ම සම්පූර්ණ නොවී පැවතුනි. | අයවැයෙන් සැලසුම් කර ඇති වැඩ නිම කළ යුතුය. | වැඩ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |